# 10. සැමට බලාපොරොත්තුවක්

**මරණයෙන් උත්ථාන ව ජීවමානව වැඩ සිටි ජේසුස් වහන්සේ මුණ ගැසීමෙන්, තෝමස් තුළ ජීවිත වෙනස්කමක් ඇති විය. ජීවිතයට නව බලාපොරොත්තුවක් ඇති විය. එය අපගේ ජීවිතයට ද අදාළ කර ගැනීම පිළිබඳව ඉගෙන ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

## ශු. ජොහාන් 20: 24-29

ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන වී (පුනරුජ්ජීවනය/නැවත නැගිටීම) දින 40 ක් මුළුල්ලේ ශ්‍රාවකයන්ට සහ නොයෙකුත් අයට පෙනුණු සේක. බොහෝ අය ජුදෙව්වන්ට බියෙන් බලාපොරොත්තු රහිතව විසිර ගියහ. ජේසුස් වහන්සේ තමන්ට දර්ශනය වූ බව සමහරක් දෙනා ප්‍රකාශ කළ විට බොහෝ දෙනෙක් එය විශ්වාස නො කළහ.

ඒ අය අතුරෙන් බයිබලයේ සඳහන් වන ශ්‍රාවකයකු වන්නේ තෝමස් ය.

ඔහු නිවුන් දරුවා යැයි නම් ලත් තෝමස් ය.

අනෙක් ශ්‍රාවකයන් උත්ථාන වුණ ජේසුස් වහන්සේ දුටු බව පැවසූ විට එය කිසිවිටකත් විශ්වාස කරන්නට තෝමස්ට හිත නොදුනි. එම සැකය හා බලාපොරොත්තු නැති වීමේ තත්ත්වය තුළ ඔහු පැවසූයේ;

**"උන් වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක<br>ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා<br>උන් වහන්සේගේ ඇලයෙහි<br>මාගේ අත දමා බැලුවොත් මිස<br>නැත්නම් විශ්වාස නොකරමි." යන්නයි.<br>ශු. ජොහාන් 19: 25**

තෝමස්, උත්ථාන වූ ජේසු ස්වහන්සේ;

දැකීමෙන්

→ පමණක් විශ්වාස කරන බව පැවසීම

ස්පර්ශ කිරීමෙන්

මේ සඳහා ඔහුට අවස්ථාව ලැබුණේ ද?



**කියවා බලමු**
**ශු.ජොහාන් 20:26-28**

## තෝමස්;

උත්ථාන වූ ජේසුස් වහන්සේ පෙන්වූ අත් ද ඇලය ද දුටුවේ ය.

උත්ථාන වූ ජේසුස් වහන්සේට සවන් දුන්නේ ය.

උන් වහන්සේ දුන් ශාන්තිය තුළ දිරිමත් විය. සවිය ලැබී ය.

සැකය මගහැර සිය විශ්වාසය තහවුරු කර ගත්තේ ය.

උන් වහන්සේ තුළ සිය බලාපොරොත්තු ස්ථිර කර ගත්තේ ය.

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කළ ප්‍රථම ශ්‍රාවකයා විය. ඒ "මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි" යනුවෙන් ප්‍රකාශ කරමිනි.

ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ ව විශ්වාස නොකළ තෝමස් ජේසුස් වහන්සේ මුණ ගැසීමෙන් පසුව, උන් වහන්සේ ජීවමානව වැඩ සිටින බව විශ්වාස කළේ ය. එපමණක් ද නොව, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ බව ද නොබිය ව ප්‍රකාශ කළේ ය.

## අපගේ ජීවිතයේ;

සැක, සංකා මතුවන විට,

අභියෝගවලට මුහුණ දෙන විට,

පරාජය වීම් අත් දකින විට,

දුක් වේදනා තුළින් ගමන් කරන විට

ජේසුස් වහන්සේ උත්ථානව සිටින නිසා, උන් වහන්සේ අපගේ ජීවිතයට ශාන්තිය, සාමදානය හා බලාපොරොත්තුව ලබා දෙනු ඇත.

**උත්ථාන වූ ජේසුස් වහන්සේ**

- පිළිගන්න ඔබේ ජීවිතයට.....
- විශ්වාස කරන්න එක ම ස්වාමින් බව.....
- දකින්න සමීප වන්න දේව වදන් මගින්....
- සමග කථා කරන්න ඔබේ යාච්ඤාවෙන්..
- පිළිබඳ ශුභාරංචිය අන් අයට කියමු.....

එවිට ඔබ,

**උන් වහන්සේ නොදුටු නමුත් ඇදහූ බැවින් භාග්‍යවන්තයකු වේ.**
**(ජොහාන් 20: 29)**

මෙසේ පුනරුප්ජීවනය වූ ජේසුස් වහන්සේ තුළින් අපේ ජීවිත අලුත් කර ගනිමු. ප්‍රීතියෙන් හා ධෛර්යයෙන් යුතුව ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම**

1. ජේසුස් වහන්සේ තෝමස්ට දර්ශනය වූ අවස්ථාව දෙබසක් මගින් ඉදිරිපත් කරන්න.

2. පුනරුප්ජීවනය වූ (උත්ථාන වූ) ජේසුස් වහන්සේ ලබා දෙන බලාපොරොත්තුව පිළිබඳව ඔබගේ මිතුරකුට විස්තර කරන ආකාරය ලියන්න.